සියලුම
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ,
අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත,

**ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III ශ්‍රේණිය සිට අධිකරණ රෙජිස්ට්‍රාර් II ශ්‍රේණිය II පන්තියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම.**

අංක 2088/26 සහ 2018.09.11 දිනැති උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 8.14.1 ඡේදය යටතේ සඳහන් සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III ශ්‍රේණියේ නිලධරයන්ගෙන් අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ II ශ්‍රේණිය II පන්තියට උසස් කිරීම සඳහා අයදුම්පත්‍ර කැඳවීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

02. සේවා ව්‍යවස්ථාවේ 8.14.1 හි සඳහන් සුදුසුකම්

i. අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III ශ්‍රේණියේ තනතුර ස්ථිර කර තිබීම.
ii. අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III ශ්‍රේණියේ වසර 03කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලයට අදාළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබීම.
iii. අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ III ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වී තිබීම.

03. 2025.10.01 දිනට සේවා ව්‍යවස්ථාවේ 8.14.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ නිලධාරීන් එකී ව්‍යවස්ථා සංග්‍රහයේ 'ඇමුණුම 01' හි සඳහන් ආකෘතියට අනුව ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් අයදුම්පත්‍ර 2025 නොවැම්බර් 10 වැනි දින හෝ ඊට පෙර ලැබෙන පිණිස "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ 'ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ II ශ්‍රේණිය II පන්තියට උසස් කිරීම' යන්න සඳහන් කළ යුතුය.

04. කුමන හේතුවක් නිසාවත් මෙම කාර්යාලයට එවන අනෙකුත් ලේඛන සමඟ අයදුම්පත් නොඑවිය යුතු අතර අයදුම්පත් සමඟ ඊට අදාළ සුදුසුකම් සනාථ කරන සහතික හැර වෙනත් ලිපි ලේඛන අමුණා එවීම නොකළ යුතුය. මෙම උපදෙස් නොසලකා එවනු ලබන අයදුම්පත් හා ලිපි ලේඛන සම්බන්ධයෙන් වග කියනු නොලැබේ. නියමිත දිනට පසුව එවන අයදුම්පත් සහ නිසි අයුරින් සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. මෙම ලිපිය ඔබ අධිකරණයේ අධිකරණ රෙජිස්ට්‍රාර් III ශ්‍රේණියේ නිලධාරීන්ට දැන ගැනීමට සලස්වන්න.

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2025 ඔක්තෝබර් මස 13 වන දින,
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දීය.